# දැතිමෝරා සෙවීමේ ක්‍රියාකාරකම

**ඉගෙනීමේ අරමුණ**

මෙම ක්‍රියාකාරකමෙහි අරමුණ වන්නේ දැතිමෝරුන්ට එල්ලවන තර්ජන නිරූපණය කිරීම සහ මෙම තර්ජන අවම කර ගැනීම සඳහා මිනිසුන්ට උපකාර කළ හැකි ආකාරය පිළිබඳ සංවාදයක් ගොඩනැගීම යි.

**පසුබිම**

දැතිමෝරා යනු ලෝකයේ වඩාත්ම තර්ජනයට ලක් වී ඇති මත්ස්‍ය විශේෂ අතරින් එකක්වන අතර විවිධාකාර තර්ජන හේතුවෙන් ඔවුන්ගේ ගහනය අඩු වී තිබේ. මසුන් ඇල්ලීමේ ක්‍රියාකාරකම් (බොහෝ අවස්ථාවල දැතිමෝරුන් දැල්වලට හසු වන්නේ අහම්බෙනි), වාසස්ථාන විනාශය (වෙරළ සංවර්ධනය, කඩොලාන විනාශය, ගංගාවල වේලි ඉදි කිරීම ආදියෙන් සිදු වන), දූෂණය සහ මිනිසුන් විසින් නිපදවන ලද අපද්‍රව්‍ය (අත්හැර දැමූ මාදැල්, බිලී කොකු ලණු සහ සහ විවිධ කැලි කසළ ආදිය) ඇතුළත් වේ. කිඹුලන් සහ මෝරුන් විසින් සමහර කුඩා දැතිමෝරුන්ව ගොදුරු කර ගැනීම වැනි ස්වභාවික තර්ජනවලට ද දැතිමෝරුන් මුහුණ දෙයි. ලොව පුරා දැතිමෝරුන් ගහනය තවදුරටත් පහත වැටීම වැළැක්වීම සඳහා, මිනිසා විසින් ඇති කරන තර්ජන අවම කිරීම හරහා දැතිමෝරුන් සංරක්ෂණයට ඔබටත් දායක විය හැකිය.


**සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය**

- පෝස්ටරය. මෙම පෝස්ටරය PDF ආකෘතියේ ප්‍රමාණ තුනකින් (සෙ.මී. 31 x සෙ.මී. 46, සෙ.මී. 46 x සෙ.මී. 69, හෝ සෙ.මී. 61 x සෙ.මී. 91) 300 dpi ගුණාත්මයෙන් ලබාගත හැකිය. මෙම මිනුම් වෙනස් කිරීමෙන් රූපයේ ගුණාත්මකභාවය අඩු විය හැක.



**පාඩම**

1. සහභාගිවන්නන්හට ලොව පුරා සිටින ජලජ සතුන් සහ ඔවුන්ගේ වාසස්ථාන අඩංගු සමුද්‍රාශ්‍රිත දසුනෙහි සිටින සැඟවුණු දැතිමෝරා සෙවීමට සලස්වන්න. දැතිමෝරාට සමාන කියත් මෝරා, සප්පරා, මොරල්ලා පැඩ්ල්ෆිෂ් ඇතුළු බොහෝ මසුන් සහ එක් දැතිමෝරෙකු පමණක් සිටින බැවින් මෙය දුෂ්කර විය හැකිය.



2. ඔවුන් දැතිමෝරා සොයාගත් පසු, දැතිමෝරුන්ට හානි කළ හැකි යමක් ඔවුන් දුටුවේ දැයි විමසන්න. දැතිමෝරුන්ට ඇති විවිධ තර්ජන පෙන්වා දෙන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න. තර්ජනයක් විය හැකි දෑ වන්නේ:

    a. **වේලි** – වේලි මගින් සමහර මසුන් විශේෂ අභිජනනය කිරීමට භාවිතා කරන, ගංගාවල ඉහළ කොටස් වෙත ගමන් කිරීමට ඇති හැකියාව අවහිර කරයි.

    b. **වෙරළතීර සංවර්ධනය/කඩොලාන විනාශය** – දැතිමෝරුන් විලෝපිකයන්ගෙන් ආරක්ෂා වීමට සහ ආහාර සොයා ගැනීමට කඩොලාන සහ අනෙකුත් වෙරළාසන්න ප්‍රදේශ යොදා ගනී.

    c. **දූෂණය/පිටාර ගැලීම** – සියලුම මසුන්ට මෙන්, දැතිමෝරුන්ට ජීවත් වීමට සෞඛ්‍ය සම්පන්න පරිසරයක් අවශ්‍ය වේ

    d. **දැල් සහ බිලී කොකුවලින් මාලු බෑම** – නොදැනුවත්වම දැල්වලට සහ බිලී කොකුවලට හසුවන දැතිමෝරුන් ඒවායෙන් ඉවත් කිරීම සඳහා මරා දැමීම සිදු වේ.

    e. **අත්හැර දැමූ දැල්** – ගිලීහී ගිය සහ ඉවතලනු ලැබූ දැල්වලට දැතිමෝරුන් පහසුවෙන්ම පැටලී මිය යාම සිදු වේ.

    f. **ඉවතලන අපද්‍රව්‍ය** (උදා: ප්ලාස්ටික් බෑග්, ඇසුරුම් 6 ප්ලාස්ටික් වළලු) - ඉවතලන කසළ නිසා දැතිමෝරුන්ගේ ඇති පැටලී හානි විය හැක.

    g. **කිඹුලන් (ස්වභාවික තර්ජනයකි)** – සමහර කිඹුලන් දැතිමෝර පැටවුන්ගේ විලෝපිකයන් වේ.

    h. **මෝරුන් (ස්වභාවික තර්ජනයකි)** – ගොන් මෝරුන් (bull shark) වැනි සමහර මෝරුන් දැතිමෝර පැටවුන්ගේ විලෝපිකයන් වේ.



SAWFISH CONSERVATION SOCIETY

save our seas foundation

3. ඔවුන් රූපයේ ඇති විවිධ තජර්න සොයාගත් පසු, එම තජර්නවලින් දැතිමෝරුන් ආරක්ෂා කර ගන්නා ආකාරය පිළිබඳ ඔවුන් සිතන්නේ මොනවා දැයි විමසන්න. විසඳුම් ලෙස දැක්විය හැක්කේ:
    a. වේලි ඉදිකිරීමෙන් වැළකීම, වේලි ඉවත් කිරීම, හෝ දැතිමෝරුන් ජීවත්වන ගංගාවල ඇති වේලිවල වටින් හෝ ඒ හරහා යාමට දැතිමෝරුන්ට ගමන් මාර්ග පිළිසකර කර දීම.

    b. දැතිමෝරුන් ජීවත්වන කඩොලාන වැනි ප්‍රදේශවල වෙරළ සංවධර්නය සිදු කිරීමෙන් වැළකීම සහ කඩොලාන සිටුවීම වැනි වෙරළ ප්‍රතිසාධන ක්‍රියාකාරකම්වලට උපකාර කිරීමෙන් දැතිමෝරුන්ගේ වාසස්ථාන ආරක්ෂා කිරීම.

    c. පොහොර, තෙල් සහ අනෙකුත් දූෂකවලින් ජල මාගර් දූෂණය නොකිරීම.

    d. දැතිමෝරුන් ජීවත්වන ප්‍රදේශවල මාළුදැල් භාවිත නොකිරීම, සහ SCS දැතිමෝරුන් හඳුනාගැනීමේ සහ මුදා හැරීමේ පත්‍රිකාවේ (https://www.sawfishconservationsociety.org/international-sawfish-day) සඳහන් ක්‍රම භාවිත කරමින් දැල්වල පැටලී සිටින දැතිමෝරුන් (ඔවුන්ගේ දැතිවලට හානි නොවන සේ) පණපිටින් මුදා හැරීම.

    e. ගංගාවල, සාගරයේ හෝ ගොඩබිමෙහි ඇති කසළ එකතු කිරීම. ඉවතලනු ලබන බිලී කොකු රැහැන්, මාළුදැල් සහ අපද්‍රව්‍ය බොහෝ විට ගංගාවලට සහ සාගරයට ගසාගෙන යාම සිදු වේ.

    f. කිඹුලන් සහ මෝරුන් සමහර අවස්ථාවල දී දැතිමෝර පැටවුන් ගොදුරු කරගන්නා අතර, කිඹුලන් සහ මෝරුන් වැදගත් විලෝපිකයන් වන බැවින්, දැති මෝරුන් ආරක්ෂා කිරීමේ අරමුණින් එම විලෝපිකයන් මරා දැමීම හෝ ඉවත් කිරීම සිදු නොකළ යුතුයි. දැතිමෝරුන්ට තම දැති භාවිතයෙන් විලෝපිකයන්ගෙන් ආරක්ෂා විය හැකිය.

## බෝනස් ක්‍රියාකාරකම: දැතිමෝරෙක් කුමන ආකාර ද?

**ඉගෙනීමේ අරමුණ**

මෙම බෝනස් ක්‍රියාකාරකමේ අරමුණ වන්නේ දැතිමෝරෙකු හඳුනා ගන්නා ආකාරය නිදශර්නය කිරීමයි.

**පසුබිම**

දැතිමෝරුන් යනු මෝරෙකුට සමාන පෙනුමක් ඇති මඩුවන් වන අතර, අනෙකුත් බොහෝ මසුන්ගෙන් වෙන්කර හඳුනා ගැනීමට පහසු වන දත් සහිත දිගු දැත්තක් ඔවුන්ට ඇත. කෙසේ නමුත්, මෙම දැතිමෝරුන් ලෝකයේ විවිධ කලාපවල දක්නට ලැබෙන කියත් මෝරා, පැඩ්ල්ෆිෂ්, මොරල්ලා, සහ සප්පරා වැනි විවිධ බිල්ෆිෂ් වගර්යේ මසුන් ඇතුළු මසුන් වගර් කිහිපයක් ලෙස වරදවා වටහා ගැනීම සිදු වේ. මෙම මසුන්ට දැතිමෝරා හා සමාන පෙනුමක් තිබිය හැකි වුවත්, ඔවුන් වෙන්කර හඳුනා ගැනීමට පහසු ක්‍රම තිබේ.


**නිමර්ාණයට අවශ්‍ය ද්‍රව්‍ය**

- පෝස්ටරය. මෙම පෝස්ටරය PDF ආකෘතියේ ප්‍රමාණ තුනකින් (සෙ.මී. 31 x සෙ.මී. 46, සෙ.මී. 46 x සෙ.මී. 69, හෝ සෙ.මී. 61 x සෙ.මී. 91) 300 dpi ගුණාත්මයෙන් ලබාගත හැකිය. මෙම මිනුම් වෙනස් කිරීමෙන් රූපයේ ගුණාත්මකභාවය අඩු විය හැක.



**පාඩම**

1. සහභාගීවන්නන්ට දැතිමෝරෙකු (උන්ගේ හිසේ ඇති දත් සහිත දිගු හා පළල් දැත්ත, හිසට <u>යටින්</u> ඇති කරමල විවර 5, සහ පැතලි, මෝරෙකුගේ වැනි ශරීරය) හඳුනා ගත හැකි ආකාරය පවසන්න. ඉන්පසු සහභාගිවන්නන් ලවා සැඟවුණු දැතිමෝරා සොයන්නට සලස්වන්න. දැතිමෝරාට සමාන පෙනුමක් ඇති කියත් මෝරා, සප්පරා, මොරල්ලා සහ පැඩ්ල්ෆිෂ් ඇතුළු බොහෝ මසුන් සිටින බැවින් මෙය දුෂ්කර විය හැකිය.




2. සහභාගිවන්නෙකු දැතිමෝරා හැර වෙනත් මාළුවෙකු පෙන්වූයේ නම්, ඔවුන් සොයාගත් මසුන් වගර්ය පැහැදිලි කර එම මාළුවා සහ දැතිමෝරා අතර වෙනස කුමක් දැයි පැහැදිලි කරන්න.


   a. කියත් මෝරා (sawshark) යනු දැතිමෝරාට සමාන දැත්තක් සහිත මෝරුන් විශේෂයක් වන නමුත් ඔවුන්ගේ දැත්තෙහි අඩ දුරක් වන්නට දිග අංකුට (ලොකු රැවුල් ගස් මෙන් පෙනේ) දෙකක්, හිසේ <u>දෙපස</u> කරමල් 5 බැගින් ඇති අතර, සම්පූණර්යෙන් වැඩුණු විට ප්‍රමාණයෙන් දැතිමෝරාට වඩා කුඩා වේ. කියත් මෝරා සාගරයේ ජීවත් වේ.



   b. සප්පරා (swordfish) සහ අනෙකුත් බිල්ෆිෂ් වගර්යේ මසුන් යනු දිග, කෙට්ටු සහ දත් නොමැති කඩුවක් වැනි හොටයක් සහ හිසෙහි <u>දෙපස</u> කරමල් 1 බැගින් ඇති විශාල අස්ථික මසුන් වේ. සප්පරුන් සහ අනෙකුත් බිල්ෆිෂ් වගර්යේ මසුන් සාගරයේ ජීවත් වේ.



c. පැඩ්ල්ෆිෂ් (paddlefish) යනු විශාල, ආදිකාලීන මසුන් වගර්යක් වන අතර ඔවුන්ගේ හිස මත දිගු, පළල් සහ දත් රහිත හබලක්, හිස දෙපැත්තෙහි කරමල් එක බැගින් සහ විශාල විවරයක් සහිත (විවෘත කළ විට) කටක් ඇත. පැඩ්ල්ෆිෂ් මිරිදිය ගංගාවල ජීවත් වේ.



d. මොරල්ලන් (gar) යනු සිහින් සිරුරක් සහ තියුණු දත් ඇති දිග හා පටු මුඛයක් සහිත අස්ථික මසුන් වන අතර උන්ගේ හිස දෙපැත්තෙහි කරමල් 1 බැගින් ඇත. මිරිදිය ගංගා සහ විල් සහ/හෝ මෝය සහ බොකු ආශ්‍රිතව විවිධ මොරල්ලන් විශේෂ දක්නට ලැබේ.

